# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2355/18 - 2023 ඔක්තෝබර් මස 24 වැනි අඟහරුවාදා - 2023.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කඩු/ඉඩම්/04/136E/අති/RDA.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/5/2020/HW/201.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යවන පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔරුවල (කඩුවෙල මහ නගර සභා සීමාව තුළ) ගමේ, අංක 487, ඔරුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2023.02.14 දිනැතිව පිළියෙල කරන ලද ක.සි අංක 522034, කලාප අංක 02, පත්‍ර අංක 1 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0103 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (05) :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංකය 1007, කඩුවෙල පාර; ඉඩමේ විස්තරය : ගෙවත්ත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : ඒ. එච්. එල්. සුගත් කුමාර, අංක 98/ඒ, ඔරුවල, අතුරුගිරිය (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය : හෙක්ටයාර් 0.0001.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංකය 1005, කඩුවෙල පාර; ඉඩමේ විස්තරය : ගෙවත්ත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : එල්. ලලිත් රුවන් කුමාර, අංක 98, ඔරුවල, අතුරුගිරිය (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය : හෙක්ටයාර් 0.0029.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංකය නොදනී, කඩුවෙල පාර; ඉඩමේ විස්තරය : පාර; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : සොයාගත නොහැක (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය : හෙක්ටයාර් 0.0006.

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංකය 995, කඩුවෙල පාර; ඉඩමේ විස්තරය : ගෙවත්ත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : කේ. ජී. ජී. සුගතදාස, අංක 102, ඔරුවල, අතුරුගිරිය (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය : හෙක්ටයාර් 0.0046.

05. **කැබලි අංක 05**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංකය 987 සහ 989, කඩුවෙල පාර; ඉඩමේ විස්තරය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : එස්. ඒ. දෝන ජයරංජනී, අංක 104, ඔරුවල, අතුරුගිරිය (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය : හෙක්ටයාර් 0.0021.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 නොවැම්බර් මස 27 වැනි දින පෙ.ව. 10.00ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 නොවැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයක්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එස්. සම්පත් ඉඩම්ගොඩගේ,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0237

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KMB/LAN/ACQUI/07/75.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2014/HW/159.

2020 ජූලි මස 10 වැනි දින අංක 2183/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* තෙවැනි කොටසේ 7 වැනි වගන්තිය යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති දැන්වීමේ කැබලි අංක 243 හි බිම් ප්‍රමාණය ලෙස සඳහන්ව ඇති හෙක්ටයාර් 1 යන්න පර්චස් 0.02 (වර්ග මීටර් 0.4) යනුවෙන් නිවැරදි විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම්
අත්කර ගැනීමේ නිලධාරි,
කඹුරුපිටිය.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0238

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.